කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2023

2025 - මැයි

**BCOME 1065 - විද්‍යුත් වාණිජ්‍යය සහ තොරතුරු තාක්ෂණය හැඳින්වීම**

ප්‍රශ්න සංඛ්‍යාව : පහයි (05) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ) ව්‍යාපාරයක් තුල තොරතුරු තාක්ෂණ යටිතලය (IT Infrastructure) යන සංකල්පය පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 04)

ආ) පද්ධති මෘදුකාංග (System Software) සහ යෙදුම් මෘදුකාංග (Application Software) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) තොරතුරු තාක්ෂණය (IT) භාවිතය තුළින් රජයකට තම සේවාවන් පුළුල් සහ වැඩිදියුණු කර පුරවැසියන්ට ලබාදිය හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**( මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) පරිගණක ජාලයක වාසි හතරක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 04)

ආ) ස්ථානීය ප්‍රදේශ ජාල (LAN) සහ පුළුල් ප්‍රදේශ ජාල (WAN ) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) ආයතනයකට සංවිධානයකට ස්ථානීය ප්‍රදේශ ජාලයක් (LAN) නිර්මාණය කර එය අන්තර්ජාලයට සම්බන්ධ කළ හැක්කේ කෙසේද? මෙම සැකසුම සඳහා අවශ්‍ය ජාලකරණ උපාංග සහ පියවර සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) විද්‍යුත් වාණිජ්‍යය, සම්ප්‍රදායික වාණිජ්‍යයෙන් වෙනස් වන ඊට අනන්‍ය ලක්ෂණ හතරක් විස්තර කරන්න.

(ලකුණු 04)

ආ) B2B සහ C2C යන විද්‍යුත් වාණිජ්‍ය ව්‍යාපාර ආකෘති අතර වෙනස උදාහරණ සමග පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) ප්‍රධාන විද්‍යුත් වාණිජ්‍ය ආදායම් ආකෘති හතරක් ඒවායේ ආදායම් උපයන ආකාරය පිළිබඳ උදාහරණ සමගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) තොරතුරු ආරක්ෂණයේදී භාවිතාවන මැක්කියුම්බර් (McCumber) ආදර්ශ රාමුව පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 04)

ආ) වයිට් හට් හැකර්ස් (White Hat Hackers) සහ ග්‍රේ හැට් හැකර්ස් (Grey Hat Hackers) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) සංවිධානයකට ආරක්ෂක උල්ලංඝනයක් (Security Breach) හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක දෙකක් සාකච්ඡා කර ඒවා වැළැක්වීමට ගත හැකි පියවර දෙකක් යෝජනා කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ) විද්‍යුත් වාණිජ්‍යයේදී භාවිතාවන විකුණුම් පුනීල (Sales Funnel) සංකල්පයේ ඇති වැදගත්කම පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 04)

ආ) විද්‍යුත් වාණිජ්‍ය වෙළඳ නාමයකට එහි වෙළඳ නාම දැනුවත්භාවය (Brand Awareness) වැඩි කළ හැකි ඩිජිටල් ක්‍රම තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) අන්තර්ජාල නිමිඇඳුම් වෙළඳ නාමයකට (Online Clothing Brand) එහි සාමාන්‍ය ඇණවුම් අගය (Average Order Value) වැඩි කර ගැනීම සඳහා භාවිතා කළ හැකි ඩිජිටල් උපාය මාර්ග දෙකක් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**